අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

+9411 2784161
+9411 2784869
moepressroom3@gmail.com

මාධ්‍ය නිවේදනය | ஊடக வெளியீடு | MEDIA RELEASE

MEDIA UNIT

EDU-0138

2026-06-01

# දිවයින පුරා රාජ්‍ය විශ්වවිද්‍යාලවල සිසුන් 16,000ක් සඳහා නව නේවාසිකාගාර ව්‍යාපෘති 55ක් ක්‍රියාත්මක කෙරේ.

විශ්වවිද්‍යාල සිසුන්ගේ නේවාසික පහසුකම් සංවර්ධනය සඳහා දිවයින පුරා රාජ්‍ය විශ්වවිද්‍යාලවල නව නේවාසිකාගාර ව්‍යාපෘති 55 ක් ක්‍රියාත්මක කරන බව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය සඳහන් කරයි. එම ව්‍යාපෘති අදියර 3 කින් ක්‍රියාත්මක වන අතර එක් එක් විශ්වවිද්‍යාල සඳහා ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල වත්මන් ප්‍රගතිය පහත පරිදි වේ.

## 1. නැගෙනහිර විශ්වවිද්‍යාලය

| | |
|---|---|
| ලැබෙන සමස්ත ව්‍යාපෘති ගණන | : නව නේවාසිකාගාර ව්‍යාපෘති 05කි. |
| නේවාසිකාගාර වර්ග | :Model A (සිසුන් 400) වර්ගයේ නේවාසිකාගාර 03ක් සහ Model B (සිසුන් 200) වර්ගයේ නේවාසිකාගාර 02කි. |
| පහසුකම් ලබන මුළු සිසුන් සංඛ්‍යාව | : සරසවි සිසුන් 1,600කි. |
| වත්මන් ප්‍රගතිය | : එක් නේවාසිකාගාරයක් ඉදිකිරීමේ මිලගණන් කැඳවීම් (Bids) 2026 අප්‍රේල් 30 වනදා විවෘත කර ඇති අතර, දැනට සුදුසුම ආයතනය තෝරාගැනීමේ ඇගයීම් කටයුතු සිදු කෙරේ. |

## 2. යාපනය විශ්වවිද්‍යාලය

| | |
|---|---|
| ලැබෙන සමස්ත ව්‍යාපෘති ගණන | : නව නේවාසිකාගාර ව්‍යාපෘති 02කි. |
| නේවාසිකාගාර වර්ග | : Model A (සිසුන් 400) වර්ගයේ නේවාසිකාගාර 01ක් සහ Model B (සිසුන් 200) වර්ගයේ නේවාසිකාගාර 01කි. |
| පහසුකම් ලබන මුළු සිසුන් සංඛ්‍යාව | : සරසවි සිසුන් 600කි. |
| වත්මන් ප්‍රගතිය | : එක් නේවාසිකාරයක් ඉදිකිරීමේ ටෙන්ඩර් මිලගණන් 2026 අප්‍රේල් 02 වනදා විවෘත කර ඇති අතර, විශ්වවිද්‍යාලය මඟින් එම යෝජනා ඇගයීමේ කටයුතු මේ දිනවල ක්‍රියාත්මක වේ. |

## 3. සබරගමුව විශ්වවිද්‍යාලය

| | |
|---|---|
| ලැබෙන සමස්ත ව්‍යාපෘති ගණන | : නව නේවාසිකාගාර ව්‍යාපෘති 07කි. |
| නේවාසිකාගාර වර්ග | : Model A (සිසුන් 400) වර්ගයේ නේවාසිකාගාර 04ක් සහ Model B (සිසුන් 200) වර්ගයේ නේවාසිකාගාර 03ක්. |
| පහසුකම් ලබන මුළු සිසුන් සංඛ්‍යාව | : සරසවි සිසුන් 2,200කි. |
| වත්මන් ප්‍රගතිය | : එක් නේවාසිකාගාරයක් ඉදි කිරීමේ ටෙන්ඩර් මිලගණන් කැඳවීමේ කටයුතු 2026 මැයි 20 වනදා සිදු කර ඇත. |

**4. අග්නිදිග විශ්වවිද්‍යාලය**

| | |
|---|---|
| ලැබෙන සමස්ත ව්‍යාපෘති ගණන | : නව නේවාසිකාගාර ව්‍යාපෘති 06කි. |
| නේවාසිකාගාර වර්ග | : Model A (සිසුන් 400) වර්ගයේ නේවාසිකාගාර 04ක් සහ Model B (සිසුන් 200) වර්ගයේ නේවාසිකාගාර 02කි. |
| පහසුකම් ලබන මුළු සිසුන් සංඛ්‍යාව | : සරසවි සිසුන් 2,000කි. |
| වත්මන් ප්‍රගතිය | : එක් නේවාසිකාරයක් ඉදිකිරීම සඳහා වන ටෙන්ඩර් මිලගණන් 2026 මැයි 21 වනදා නිල වශයෙන් විවෘත කර ඉදිරි පියවර ගනිමින් පවතී. |

**5. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

| | |
|---|---|
| ලැබෙන සමස්ත ව්‍යාපෘති ගණන | : නව නේවාසිකාගාර ව්‍යාපෘති 04කි. |
| නේවාසිකාගාර වර්ග | : Model A (සිසුන් 400) වර්ගයේ නේවාසිකාගාර 02ක් සහ Model B (සිසුන් 200) වර්ගයේ නේවාසිකාගාර 02කි. |
| පහසුකම් ලබන මුළු සිසුන් සංඛ්‍යාව | : සරසවි සිසුන් 1,200කි. |
| වත්මන් ප්‍රගතිය | : එක් නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා වන නිල ටෙන්ඩර් සහ නීතිමය ලියකියවිලි (Bidding Documents) සකස් කිරීමේ කටයුතු මේ වන විට සිදු කෙරේ. |

**6. රජරට විශ්වවිද්‍යාලය**

| | |
|---|---|
| ලැබෙන සමස්ත ව්‍යාපෘති ගණන | : නව නේවාසිකාගාර ව්‍යාපෘති 07කි. |
| නේවාසිකාගාර වර්ග | : Model A (සිසුන් 400) වර්ගයේ නේවාසිකාගාර 04ක් සහ Model B (සිසුන් 200) වර්ගයේ නේවාසිකාගාර 03ක්. |
| පහසුකම් ලබන මුළු සිසුන් සංඛ්‍යාව | : සරසවි සිසුන් 2,200කි. |
| වත්මන් ප්‍රගතිය | : එක් නේවාසිකාගාරයක් ඉදි කිරීමට ඉදිකිරීම්කරුවන් තෝරාගැනීම සඳහා වන මිලගණන් කැඳවීම 2026 මැයි 21 වනදා සාර්ථකව විවෘත කර ඇත. |

**7. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**

| | |
|---|---|
| ලැබෙන සමස්ත ව්‍යාපෘති ගණන | : නව නේවාසිකාගාර ව්‍යාපෘති 06කි. |
| නේවාසිකාගාර වර්ග | : Model A (සිසුන් 400) වර්ගයේ නේවාසිකාගාර 03ක් සහ Model B (සිසුන් 200) වර්ගයේ නේවාසිකාගාර 03ක්. |
| පහසුකම් ලබන මුළු සිසුන් සංඛ්‍යාව | : සරසවි සිසුන් 1,800කි. |
| වත්මන් ප්‍රගතිය | : එක් නේවාසිකාගාරයක් ඉදිකිරීමට ඉදිකිරීම් සමාගම් සමඟ මූලික සාකච්ඡා (Pre-bid meeting) පවත්වා ඇති අතර, මිලගණන් කැඳවීම 2026 මැයි 22 දින සිදු කර ඇත. |

**8. වවුනියාව විශ්වවිද්‍යාලය**

| | |
|---|---|
| ලැබෙන සමස්ත ව්‍යාපෘති ගණන | : නව නේවාසිකාගාර ව්‍යාපෘති 04කි. |
| නේවාසිකාගාර වර්ග | : Model A (සිසුන් 400) වර්ගයේ නේවාසිකාගාර 02ක් සහ Model B (සිසුන් 200) වර්ගයේ නේවාසිකාගාර 02කි. |
| පහසුකම් ලබන මුළු සිසුන් සංඛ්‍යාව | : සරසවි සිසුන් 1,200කි. |

වත්මන් ප්‍රගතිය : එක් නේවාසිකාගාරයක් සඳහා මිලගණන් ඇගයීමේ වාර්තාව (Technical Evaluation Report) මේ වන විට සකස් වෙමින් පවතී.

**9. මොරටුව විශ්වවිද්‍යාලය**

ලැබෙන සමස්ත ව්‍යාපෘති ගණන : නව නේවාසිකාගාර ව්‍යාපෘති 02කි.
නේවාසිකාගාර වර්ග : Model B (සිසුන් 200) වර්ගයේ නේවාසිකාගාර 02ක් පමණි.
පහසුකම් ලබන මුළු සිසුන් සංඛ්‍යාව : සරසවි සිසුන් 400කි.
වත්මන් ප්‍රගතිය : එක් නේවාසිකාගාරයක් සඳහා 2026 මැයි 17 වනදා වන විට මිල ගණන් කැඳවීම් අරඹා ඇත.

10. වයඹ විශ්වවිද්‍යාලය

ලැබෙන සමස්ත ව්‍යාපෘති ගණන : නව නේවාසිකාගාර ව්‍යාපෘති 04කි.
නේවාසිකාගාර වර්ග : Model A (සිසුන් 400) වර්ගයේ නේවාසිකාගාර 02ක් සහ Model B (සිසුන් 200) වර්ගයේ නේවාසිකාගාර 02කි.
පහසුකම් ලබන මුළු සිසුන් සංඛ්‍යාව : සරසවි සිසුන් 1,200කි.
වත්මන් ප්‍රගතිය : එක් නේවාසිකාගාරයක් සඳහා ටෙන්ඩර් ලේඛනය පිළියෙල කිරීමේ කටයුතුවල නිරත වෙමින් සිටී.

**11. රුහුණ විශ්වවිද්‍යාලය**

ලැබෙන සමස්ත ව්‍යාපෘති ගණන : නව නේවාසිකාගාර ව්‍යාපෘති 04කි.
නේවාසිකාගාර වර්ග : Model B (සිසුන් 200) වර්ගයේ නේවාසිකාගාර 04ක් පමණි.
පහසුකම් ලබන මුළු සිසුන් සංඛ්‍යාව : සරසවි සිසුන් 800කි.
වත්මන් ප්‍රගතිය : එක් නේවාසිගාරයක් ඉදි කිරීම සඳහා වැඩබිම තුළ ප්‍රායෝගික වැඩ අරඹමින්, ඉදිකිරීමට නියමිත භූමිය සකස් කිරීමේ කටයුතු මේ වන විට 75%ක් නිම කර ඇත.

12. ත්‍රිකුණාමලය මණ්ඩපය

ලැබෙන සමස්ත ව්‍යාපෘති ගණන : නව නේවාසිකාගාර ව්‍යාපෘති 02කි.
නේවාසිකාගාර වර්ග : Model B (සිසුන් 200) වර්ගයේ නේවාසිකාගාර 02 කි.
පහසුකම් ලබන මුළු සිසුන් සංඛ්‍යාව : සරසවි සිසුන් 400කි.
වත්මන් ප්‍රගතිය : සැලසුම් කර ඉදිකිරීමේ (Design and Build) පදනම මත එක් නේවාසිකාගාරයක් ඉදි කිරීම සඳහා 2026 අප්‍රේල් 09 සිට මැයි 27 දක්වා කාලය තුළ මිලගණන් කැඳවා අවසන් කර ඇත.

13. ගම්පහ වික්‍රමාරච්චි විශ්වවිද්‍යාලය

ලැබෙන සමස්ත ව්‍යාපෘති ගණන : නව නේවාසිකාගාර ව්‍යාපෘති 02කි.
නේවාසිකාගාර වර්ග : Model B (සිසුන් 200) වර්ගයේ නේවාසිකාගාර 02ක් පමණි.
පහසුකම් ලබන මුළු සිසුන් සංඛ්‍යාව : සරසවි සිසුන් 400කි.
වත්මන් ප්‍රගතිය : එක් නේවාසිකාගාරයක් ඉදි කිරීම සඳහා භූමිය තෝරා ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර, සැලසුම් කර ඉදිකිරීමේ ක්‍රමවේදයට අනුමැතිය හිමිව ඇත.

මාධ්‍ය ඒකකය.